**ශ්‍රී ලංකා සුමෝ සම්මේලනය - 2021**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1. මතය ප්‍රකාශනය**

**------------------**

ශ්‍රී ලංකා සුමෝ සම්මේලනයේ ("සම්මේලනය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, සමුච්චිත අරමුදල් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ප්‍රකාශනය සඳහා පදනම**

**-------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ප්‍රකාශනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල 17 (3) සහ 17 (31) වගන්තිවලට අනුව, රු. 393,310ක් වටිනා දේපළ, පිරියත සහ උපකරණවලට අදාළ ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සුමෝ ටෙන්ට් රු.115,000ක් සඳහා ක්ෂය ප්‍රතිපාදන ද සිදුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සම්පූර්ණයෙන්ම ක්ෂය වූ කුසලාන රු. 14,650ක් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ රු.8,350කින් වියදම් වැඩියෙන් සහ ස්ථාවර වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි සකස් කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| අයිතමය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපල, පිරියත සහ උපකරණවලට එකතු කිරීම් සඳහා ගෙවීම් | 221,000 | ඉන්වොයිසි සහ බිල්පත් | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | විගනණය වෙත නිසි සහ ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.5.4 ගෙවිය යුතු දෑ**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවිය යුතු ශේෂය රු.101,935ක් නිරවුල් කිරීමකින් හෝ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමකින් තොරව වර්ෂ 05 පුරා හිගව පැවතුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | නිරවුල් කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 47,640ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 36,211ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,429ක පිරිහීමක් නිරීක්ෂණය විය. 2021 වර්ෂයේදී ආදායම නොලැබීම මෙම පිරිහීමට හේතුවිය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් රෙගුලාසියේ 7 (xi) වගන්තියට අනුව, සම්මේලනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ජාතික ක්‍රීඩා සංගම් නියමයන්ට අනුව සංයුක්ත සැලැස්මක් නොපමාව පිළියෙල කළ යුතුය. |

.

**3.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------- | ------------------ | ------------------------- |
| ශ්‍රී ලංකා සුමෝ සම්මේලනය 2021 වර්ෂ සඳහා අයවැයක් පිළියෙල කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ සම්මේලනයේ මූල්‍ය පාලනය ඇගයීමට ලක් කිරීමට නොහැකි විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | අයවැයක් පිළියෙල කිරීමට පියවර ගත යුතුය. |